**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | --------------------------- | ----------- |
| (අ) | මුද්දර ගාස්තු, මුදල් පදනම මත ගිණුම් තැබීම ගිණුම්කරණ ප්‍රතිපත්තියක් වුවද, ඉකුත් වර්ෂ වෙනුවෙන් ලද රු.16,984,123ක මුද්දර ගාස්තු උපචිත පදනමට ගිණුම්ගත කර තිබුණි. | තවදුරටත් ඇති හිඟ ශේෂය පියවීමෙන් පසු මුදල් පදනමින් ගිණුම් සකස් කිරීමට කටයුතු කරන බව. | ඉදිරියේදී ගිණුම් ප්‍රතිපත්ති අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභාවෙන් පරිත්‍යාග වශයෙන් ලද රු.950,000ක් වූ බෙලර් යන්ත්‍රයක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | ස්ථාවර තැන්පතු දෙකක පොළිය රු.136,941ක් ගිණුම්ගත කර නොතිබුණු අතර තවත් තැන්පතුවක පොළී ආදායම රු.191,062ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පරීක්ෂාකර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | ගිණුම් විෂයයන් 06ක 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව එදිනට එම ශේෂ අතර රු.155,357,626ක වෙනසක් විය. | නොසැසඳීම් පරීක්ෂාකර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------- | -------------------------- | ---------- |
| (අ) | එකතුව රු. 1,968,712ක් වූ ගිණුම් විෂයයන් 04ක් තහවුරු කර ගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන හෝ වෙනත් මූලාශ්‍ර ලියවිලි ඉදිරිපත් නොකෙරුණි. | උපලේඛන ඉදිරිපත් නොකිරීම වරදක් ලෙස පිළිගන්නා බව. | විස්තරාත්මක උපලේඛන සකස් කළ යුතු වේ. |
| (ආ) | තැන්පතු ගිණුම් 03ක පවතින එකතුව රු.9,337,414ක හර ශේෂ හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. එමෙන්ම, ඊට අදාළ ලිඛිත තොරතුරු කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරගෙන යන බව. | අදාළ ශේෂ හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

**1.7 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371 (5) ට පටහැනිව, 1995 සිට 2019 වර්ෂ අතර කාලය තුළ අවස්ථා 43ක දී ලබා දුන් රු.2,001,389ක අත්තිකාරම් පියවා නොතිබුණි.<br>එමෙන්ම, 2017 වර්ෂයට අදාළ එකතුව රු.1,517,600ක් වූ කල් ඉකුත් වූ ටෙන්ඩර් හා විවිධ තැන්පතු, මුදල් රෙගුලාසි 571 (2) පරිදි නිරවුල් කර නොතිබුණි. | නොපියවා ඇති අත්තිකාරම් පියවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,070,808ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,982,959ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 8,561,500 | 10,595,823 | 8,778,931 | 26,327,278 | 8,641,200 | 8,630,285 | 5,263,375 | 24,359,671 |
| කුලී | 12,107,800 | 11,873,166 | 11,742,288 | 1,282,271 | 11,669,900 | 9,737,897 | 8,391,744 | 2,461,380 |
| බලපත්‍ර | | 725,135 | 723,885 | 5,250 | 874,148 | 751,567 | 756,317 | 9,750 |
| ගාස්තු | 1,072,600 | | | | | | | |
| වෙනත් ආදායම් | 7,378,300 | 7,233,149 | 6,248,096 | 1,961,071 | 4,658,100 | 4,948,316 | 3,750,347 | 2,009,066 |
| | 29,120,200 | 30,427,273 | 27,493,200 | 29,575,870 | 25,843,348 | 24,068,065 | 18,161,783 | 28,839,867 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 05ට වඩා පැරණි රු.15,181,158ක හිඟහිටි වරිපනම් ශේෂයක් හා රු.127,459ක හිඟහිටි අක්කර බදු ශේෂයක් 2022 දෙසැම්බර් 31 දිනට පැවැතිණි. | ජංගම සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා නිලධාරීන් දෙදෙනෙකු විසින් ක්ෂේත්‍රයේ කටයුතු කරමින් හිඟ ආදායම් රැස්කරන බව . | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |
| (ආ) | ඇහැලියගොඩ සතිපොළෙන් 2012 වර්ෂය වෙනුවෙන් හිඟහිටි බදු කුළී, අධිකරණ තීන්දුවකට අනුව 2016 අප්‍රේල් වනවිට ගෙවා නිමකළ යුතු වුවද, රු.180,000ක් තවදුරටත් අය වීමට පැවැතිණි. එමෙන්ම ඉකුත් වර්ෂ 02ක් සඳහා හිඟහිටි කඩකුලී රු.1,097,523ක් අයකර නොතිබුණි. | මේ වනවිට නඩුව නැවත කැඳවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇති බවත් හිඟ කඩ කුලී අයකර ගැනීම සඳහා කටයුතු කරන බව. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු පොදු වැසිකිළියකට අයත් භූමිය, දුම්රිය රක්ෂිතය හරහා පුළුල්කළ විකල්ප මාර්ගයට ඇතුළත් වූ බවට 2012 මැයි මාසයේ දී සභාවේ ලේකම්වරයා විසින් ප්‍රකාශ කර තිබුණ ද, ඊට යාබද ඉඩමේ හිමිකරු විසින් එම ඉඩම තමන් විසින් භුක්ති විඳින බවට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර තිබුණි. එසේ තිබිය දී, එම භූමියේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඔහු විසින් ඉදිරිපත් කළ ගොඩනැගිලි අයදුම්පත, 2014 මැයි මාසයේ දී සභාව විසින් අනුමත කර තිබුණි. එහෙත් අයදුම්කරුට එම ඉඩමට ඇති අයිතිය පිළිබඳ තහවුරුවක් 2022 දෙසැම්බර් දක්වාම ලබා ගෙන නොතිබුණි. | සොයාබලා පිළිතුරක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | පවතින නීති රීතිවලට යටත්ව කටයුතු කළ යුතුවේ. |

**3.2 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයිතිය සභාව සතු නොවූ වාහන 03ක අයිතිය පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ කටයුතු කර නොතිබුණු අතර අබලි වාහන 02ක් අපහරණය කර නොතිබුණි. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර අපහරණය කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. |